# තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ නීති ඇගයීමේ ක්‍රමවේදය[1]

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති ඇගයීමේ ක්‍රමවේදය රටක තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා පනවා ඇති අණ පනත් වල ප්‍රමිතිය මැනීම සඳහා යොදා ගැනෙන මෙවලමකි. එමගින් තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා කෙටුම්පත් කරන නීති හෝ පනවා ඇති නීති කෙතෙක් දුරට මහජන ආයතන සතු තොරතුරු ලබා ගැනීම සඳහා කාර්යක්ෂමව හා ප්‍රායෝගිකව යොදාගත හැකි දැයි විමසා බැලේ. මේ ක්‍රමවේදය අනුව කිසියම් රටක තොරතුරු ලබා ගැනීම බලාත්මක කිරීම සම්බන්ධයෙන් පනවා ඇති නීතිය කෙතෙක් දුරට සුදුසුදැයි මැනීම පිණිස උපරිම වශයෙන් ලකුණු 150ක මිම්මක් උපයෝගී කර ගැනේ. මේ මිම්ම තුළ තේමා හතක් යටතේ එම නීතිය විමසීම සඳහා අවශ්‍ය කරන අනු මාපකයන්ද එම මෙවලමට අඩංගුය. එකී තේමාවන් නම් රටක තොරතුරු ලබා ගැනීමේ නීතිය මගින් තහවුරු කරන (1) තොරතුරු ලබා ගැනීමේ අයිතිය සඳහා ඇති පිළිගැනීම (2) අයිතියෙන් ආවරණය වන විෂය පථයේ ප්‍රමාණය (3)තොරතුරු ඉල්ලා සිටීමේ විධික්‍රමයේ පලදායීතාවය (4)යෝග්‍ය ව්‍යතිරේක හා ප්‍රතික්ෂෙප කිරීම්වල සුපැහැදිලි ස්වභාවය (5) පලදායී අභියාචනා විධිවිධාන (6)තොරතුරු අයිතිය තහවුරු කිරීමේ ආරක්ෂණ හා දණ්ඩන සහ (7)තොරතුරු ලබාගැනීම ප්‍රවර්ධනය සඳහා යොදන විධිවිධාන වේ.[2]

මෙම ක්‍රමවේදය එළිදක්වන ලද්දේ නීතිය හා ප්‍රජාතන්තවාදය පිළිබඳ මධ්‍යස්ථානය (Center for Law and Democracy) සහ තොරතුරු සම්ප්‍රවේශය (Access Info) යන සංවිධාන දෙක විසින් පුරා වසරක් තිස්සේ කරන ලද විමර්ශන වල ප්‍රතිපලයක් වශයෙනි. රටක තොරතුරු අයිතිය පිළිබඳ නීතිය මගින් ආවරණය කළ යුතු විවිධ අංග කෙතෙක් ප්‍රශස්ත ලෙස සංගෘහිතදැයි මැනීමේදී බොහෝවිට එකකට ලකුණු 0-2 දක්වා ලැබෙන දර්ශක 61ක් මේ ක්‍රමවේදයට මූලික පදනම වී ඇත. තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති සහ ලොව පුරා විවිධ රටවල දැනට ක්‍රියාත්මක වන තොරතුරු අයිතිය පිළිබඳ අණපණත් රැසක් සංසන්දනාත්මකව විමර්ශනය කිරීමෙන් අනතුරුව සකස් කළ මෙකී දර්ශක නියාමක නියැදි කිහිපයක ආදේශ කර පරීක්ෂාවට ලක්කර වැඩිදියුණු කරන ලදී. තොරතුරු දැන ගැනීමේ නීතිය පිළිබඳ ප්‍රමාණිකයන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් මෙම කටයුත්තේදී නීතිය හා ප්‍රජාතන්තවාදය පිළිබඳ මධ්‍යස්ථානය සහ තොරතුරු සම්ප්‍රවේශය යන සංවිධාන දෙකට සහයවීය.

මෙම ක්‍රමවේදයට එක් එක් දර්ශකය සඳහා ලකුණු දීමේ සවිස්තර විධික්‍රමයක් හා ඇගයුම් ප්‍රතිපල දත්ත වශයෙන් සටහන් කිරීමේ ක්‍රමයක්ද ඇතුලත්ය. මේ ක්‍රමවේදය අනුව තොරතුරු ලබා ගැනීමේ නීතිය අගැයීමේදී මූලික අංග සම්බන්ධව පහත දක්වෙන ලකුණු සටහන භාවිත කෙරේ.

| කාණ්ඩය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. තොරතුරු ලබා ගැනීමේ අයිතිය සඳහා ඇති පිළිගැනීම | 6 |
| 2. ආවරණය වන විෂය පථයේ ප්‍රමාණය | 30 |
| 3. තොරතුරු ඉල්ලා සිටීමේ විධික්‍රමයේ පලදායීතාවය | 30 |
| 4. යෝග්‍ය ව්‍යතිරේක හා ප්‍රතික්ෂෙපකිරීම්වල සුපැහැදිලි ස්වභාවය | 30 |
| 5. පලදායී අභියාචනා විධිවිධාන | 30 |
| 6. තොරතුරු අයිතිය තහවුරු කිරීමේ ආරක්ෂණ හා දණ්ඩන | 8 |
| 7. තොරතුරු ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීමේ විධිවිධාන | 16 |
| මුලු ලකුණු සංඛ්‍යාව | 150 |

[1] මෙම ලේඛනයේ මුල් ඉංග්‍රිසි පිටපත http://rti-rating.org/methodology.html යන වෙබ් අඩවියෙන් බා ගත හැක.

[2] මෙම ක්‍රමවේදය මගින් තොරතුරු දැනගැනීමේ අයිතියට අයත් එක් සුවිශේෂ අංගයක් ආවරණය නොකෙරේ. එනම් තොරතුරු සක්‍රිය ලෙස අනාවරණය කිරීමයි. එයට හේතුව තොරතුරු සක්‍රිය ලෙස අනාවරණය කිරීම එක් සුවිශේෂ පණතක නොව අණපණත් කීපයකම අඩංගුවීමට හැකි බැවින් සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් කැපකිරීමකින් තොරව ඒ සම්බන්ධයෙන් විද්‍යානුකූල අගැයීමක් කිරීම අපහසුවීමයි.

තොරතුරු ලබාගැනීමේ අයිතියේ මූලික සතර ප්‍රමිති වශයෙන් සැලකෙන ආවරණය වන විෂය පථය, . තොරතුරු ඉල්ලා සිටීමේ විධික්‍රමයේ පලදායීතාවය, ව්‍යතිරේක හා ප්‍රතික්ෂෙපකිරීම්වල පැහැදිලි ස්වභාවය සහ පලදායී අභියාචනා විධිවිධාන සඳහා ලකුණු 30 බැගින්ද අවශේෂ අංග සඳහා අඩු ලකුණු ප්‍රමාණයක්ද යෝජනා කර ඇත. එමගින් තොරතුරු ලබාගැනීමේ අයිතියට අයත් වන ඒ ඒ ගුණාංගයන්ට අනුරූපවන ආකාරයේ වැදගත්කමක් ලබා දී ඇත.

නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මධ්‍යස්ථානය සහ යුරෝපා තොරතුරු ප්‍රවේශය යන සංවිධාන දෙක මෙම ක්‍රමවේදය ආදේශ කිරීමේ කටයුතුවල නිරන්තරයෙන්ම යෙදී සිටින අතර එමගින් සියළු රටවල තොරතුරු අයිතිය පිළිබඳ නීති අණපණත් සම්බන්ධයෙන් සංසන්දනාත්මක විමර්ශනයක් සම්පූර්ණ කර නිකුත් කිරීමටද කටයුතු යොදා ඇත.

හෙලන් ඩාබිෂයර් සහ ටෝබි මෙන්ඩල්

2010 සැප්තැම්බර් 29දා

# දර්ශක

## 1. තොරතුරු ලබා ගැනීමේ අයිතිය සඳහා ඇති පිළිගැනීම -/6

| දර්ශකය | ලකුණු පරාසය |
|---|---|
| 1. තොරතුරු ලබා ගැනීමේ අයිතිය රටෙහි නෛතික රාමුව (ව්‍යවස්ථාව/ව්‍යවස්ථාපිත නීතිය/ව්‍යවහාරික නීතිය) මගින් මූලික අයිතියක් වශයෙන් පිළිගැනෙයි. | 0-2 |
| 2. ඉතා සීමිත ව්‍යතිරේකයන් ප්‍රමාණයකදී හැරෙනවිට මහජන ආයතන සතු තොරතුරු ලබාගැනීමට ඉල්ලුම්කරුවන්ට සියලු අනුග්‍රහ දැක්වීම නීතියේ අභිප්‍රාය වෙයි. | 0-2 |
| 3. තොරතුරු දැනගැනීමේ අයිතියේ පලප්‍රයෝජන අවධාරණය කෙරෙන සහ තොරතුරු දැනගැනීමේ නීතිය පෘථුල ලෙස අර්ථවිවරණය කිරීමට කැපවන ලෙස ඉල්ලුම් කෙරෙන ප්‍රතිපත්තිමය හැඳින්වීමක් නීතියට අඩංගුවෙයි. | 0-2 |

## 2. ආවරණය වන විෂය පථයේ ප්‍රමාණය -/30

| දර්ශකය | ලකුණු පරාසය |
|---|---|
| 4. රටක සියළු දෙනාටම (පුරවැසිබව නොලත් අය හා සියලු ස්ථාපිත සංවිධානද ඇතුළුව) තොරතුරු ඉල්ලා අයදුම් කිරීමට නීතිය ඉඩ සලසයි. | 0-2 |
| 5. අදාල තොරතුරු කවුරුන් විසින් සපයන ලද්දේද යන්න නොතකා මහජන ආයතන සන්තකයේ ඇති හෝ මහජන ආයතන වෙනුවෙන් පවත්වාගෙන යන සංචිතයක අඩංගුවන ඕනෑම ආකෘතියකින් පවතින තොරතුරු ලබාගැනීමට නීතිය විධිවිධාන සලසයි. | 0-4 |
| 6. තොරතුරු ඉල්ලුම් කරන්නන්ට තොරතුරු ලබාගැනීමට මෙන්ම අදාල ලේඛන පිටපත් ලබා ගැනීමටද නීතිය ඉඩ සලසයි. (තොරතුරු ලබාගැනීම හා අභිමත ලේඛනවල පිටපත් ගැනීමද මෙයට අයත්ය.) | 0-2 |
| 7. කිසිදු මුදාහැරීමකින් තොරව විධායකයේ සියලුම ආයතනවලට තොරතුරු ලබා ගැනීමේ අයිතිය අදාළවේ. | 0-8 |
| 8. කිසිදු මුදාහැරීමකින් තොරව ව්‍යවස්ථාදායකයේ සියළුම ආයතනවලින් ඒවායේ පරිපාලනය පිළිබඳ තොරතුරුද ඇතුලත්ව සියලු තොරතුරු ලබා ගැනීමේ අයිතිය නීතියෙන් තහවුරුවේ. | 0-4 |
| 9. කිසිදු මුදාහැරීමකින් තොරව අධිකරණයේ සියළුම ආයතනවලින් ඒවායේ පරිපාලනය පිළිබඳ තොරතුරුද ඇතුලත්ව සියලු තොරතුරු ලබා ගැනීමේ අයිතිය නීතියෙන් තහවුරුවේ. | 0-4 |
| 10. තොරතුරු ලබා ගැනීමේ අයිතිය සියළු රාජ්‍ය ව්‍යවසාය ආයතනයන්ටද (රජයට අයත්/රජයේ පාලනයට නතු වාණිජ ව්‍යාපාර) අදාළවේ. | 0-2 |
| 11. තොරතුරු ලබා ගැනීමේ අයිතිය ව්‍යවස්ථානුකූල, සංස්ථාපිත හා නියාමන ආයතනයන් ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතනයන්ටද (මැතිවරණ කොමිසම, තොරතුරු කොමිසම ආදී කොමිසම් සහාද ඇතුළුව) අදාළවේ. | 0-2 |
| 12. තොරතුරු ලබා ගැනීමේ අයිතිය මහජන සේවා සපයන සියළුම පුද්ගලික ආයතනවලට සහ රජයේ අරමුදල් සැලකිය යුතුලෙස ආයෝජනය කෙරෙන පුද්ගලික ආයතනවලටද අදාළවේ. | 0-2 |

## 3. තොරතුරු ඉල්ලා සිටීමේ විධික්‍රමයේ පලදායීතාවය -/30

| දර්ශකය | ලකුණු පරාසය |
|---|---|
| 13. තොරතුරු අයදුම්කරු තොරතුරු ඉල්ලන්නේ කුමන හේතුවක් නිසාදැයි සඳහන් කළයුතු නොවේ. | 0-2 |
| 14. තොරතුරු අයදුම්කරු විසින් සැපයිය යුත්තේ අවශ්‍ය තොරතුරු හඳුනා ගැනීමට අදාලවන විස්තර හා එකී තොරතුරු සැපයිය යුතු ලිපිනය පිළිබඳ විස්තර පමණි. | 0-2 |
| 15. තොරතුරු අයදුම්කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි හා සරල අන්දමින් විස්තරවේ. අභිමත ආකාරයක සංනිවේදනයක් මගින් අයදුම්කරුට තොරතුරු අයදුම් කළ හැකි අතර ඒ සඳහා විශේෂිත ෆෝරමයක් සැපයීම හෝ තොරතුරු අයදුම්කරන්නේ තොරතුරු ලබාගැනීමේ අයිතිය පිළිබඳ නීතිය යටතේ බව සඳහන් කිරීම අවශ්‍ය නොවේ. | 0-2 |
| 16 තොරතුරු අයදුම්කරුවන්ට එම අයදුම්කිරීම් සැකසීමට ආධාර කිරීම හා තොරතුරු අයදුම් කිරීම් නොපැහැදිලි හෝ අනවශ්‍යලෙස පෘථුල වූ හෝ සුදුසු පැහැදිලි කිරීම් අවශ්‍යවූ අවස්ථාවලදී එකී අයදුම්කිරීම් නිසිලෙස සැකසීමට උදව් කිරීමද බලධාරීන්ගේ වගකීමක් වෙයි. | 0-2 |
| 17. සාක්ෂරභාවයෙන් තොරවීම, ආබාධිතවීම වැනි විශේෂ හේතු නිසා නිසිපරිදි තොරතුරු අයදුම් කිරීමට අසමත් අයදුම්කරුවන්ට තොරතුරු අයදුම් කිරීමට ආධාර කිරීම බලධාරීන්ගේ වගකීමකි. | 0-2 |
| 18. තොරතුරු අයදුම්කිරීමක් ලැබී සාධාරණ කාලයක් තුළ අයදුම්පත ලැබුණු බවට ලදුපතක් නිකුත් කළ යුතුය. මේ කාලය වැඩකරන දින පහක් නොඉක්මවයි. | 0-2 |
| 19. අදාළ තොරතුරු එම තොරතුරු අයදුම ලැබුණු බලධාරියා සතුව නොමැති අවස්ථාවලදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය පැහැදිලිව සඳහන්වේ. මේ අනුව තම ආයතනය සතුව එකී තොරතුරු නොමැති බව නොවළහා අයදුම්කරුට දැනුම්දීමත්, එම තොරතුරු ඇත්තේ කවර ආයතනකද යන්න දන්නේ නම් ඒබව අයදුම්කරුට දැනුම්දීම හෝ එකී අයදුම තොරතුරු ඇති ආයතනයේ නිසි බලධාරියා වෙත යොමු කිරීමත් අයදුම්පත ලද බලධාරියාගේ වගකීමක් වෙයි. | 0-2 |
| 20. අයදුම්කරුවන් අභිමත පරිහරණ ක්‍රමයකට අනුව තොරතුරු සපයාදීම බලධාරියාගේ වගකීම වෙයි. අභිමත පරිහරණ ක්‍රමයට විකල්පයක් ලබාදියහැක්කේ ලේඛනවල ආරක්ෂාව වැනි පැහැදිලිව පිළිගත හැකි සීමිත අවස්ථාවන්වලදී පමණි. | 0-2 |
| 21. අයදුම් සඳහා අප්‍රමාදව ප්‍රතිචාරය දැක්වීම බලධාරියාගේ වගකීම වේ. | 0-2 |
| 22. අදාල තොරතුරු ලබාගැනීමට ඇති පහසුව (තොරතුරු අඩංගු ප්‍රකාශනද ඇතුළුව) නොතකා අයදුම්කළ තොරතුරු සැපයීමේ උපරිම කාලය (වැඩකරන දින 20කට නොවැඩිව) සාධාරණව හා පැහැදිලිව නිගමනය කෙරේ. | |
| 23. තොරතුරු සැපයීමේ කාලය සාධාරණ හේතුමත දීර්ඝ කිරීම අත්‍යවශ්‍ය වූ විට එම කාලය දීර්ඝ කිරීම අතිරේක දින 20කට නොවැඩිවිය යුතු අතර ඒබව සහ දීර්ඝ කිරීම අවශ්‍යවන හේතුව කාලය දීර්ඝ කිරීමට පෙර අයදුම්කරුට දැන්වීම බලධාරියාගේ වගකීම වේ. | 0-2 |
| 24. තොරතුරු අයදුම් කිරීම සඳහා ගාස්තුවක් අය නොකෙරේ. | |
| 25. තොරතුරු ලබාදීම සඳහා ගාස්තු තීරණය කිරීමේ ක්‍රමවේදය ඒ සඳහාවන මධ්‍යගත ආයතනය මගින් පමණක් තීරණය කෙරෙන අතර අය කරන ගාස්තු තීරණය කිරීම එක් එක් ආයතනයේ තනි අභිමතය පරිදි සිදු නොකෙරේ. | 0-2 |
| 26. දිළිඳු අයදුම්කරුවන් සඳහා ගාස්තුවකින් තොරව තොරතුරු සැපයේ. | 0-2 |
| 27. නෛතික වශයෙන් අදාල තොරතුරුවල ප්‍රකාශන අයිතිය මහජන ආයතනයක් නොවන තෙවැනි පාර්ශවයකට අයත් අවස්ථාවලදී හැර මහජන ආයතන විසින් සපයනු ලබන තොරතුරු පරිහරණය කිරීම හෝ යළි භාවිතය සඳහා ගාස්තුවක් අය නොකෙරේ. | 0-2 |

## 4. යෝග්‍ය ව්‍යතිරේක හා ප්‍රතික්ෂෙපකිරීම්වල සුපැහැදිලි ස්වභාවය -/30

| දර්ශකය | ලකුණු පරාසය |
|---|---|
| 28. තොරතුරු අනාවරණය කිරීම වලක්වමින් අන්‍ය නීති රීති (රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ නීති වැනි) මගින් පනවා තිබූ සීමාවන් තොරතුරු අයිතිය පිළිබඳ නීතිය මගින් ඉවත් කෙරේ. | 0-4 |
| 29. තොරතුරු ලබාගැනීමේ අයිතියට නොගැනෙන ව්‍යතිරේක අන්තර්ජාතික ප්‍රමිති වලට අනුකූල විය යුතුය. මේ අනුව ව්‍යතිරේක වශයෙන් ගැනෙන්නේ: රටේ ආරක්ෂක විධිවිධාන; ජාත්‍යන්තර සම්බන්ධතා; මහජන සෞඛ්‍ය හා ආරක්ෂාව; නෛතික වැරදි වැළැක්වීම, විභාග කිරීම හා චෝදනා කිරීම; පෞද්ගලිකත්වය; නීත්‍යානුකූල වාණිජමය හා ආර්ථික අයිතිවාසිකම්; ආර්ථිකය පාලනය කිරීම; යුක්ති විනිශ්චයේ යහ පාලනය සහ නීති උපදේශන හා ස්ථාපිත වෘත්තීය වරප්‍රසාද, පරිසර ආරක්ෂණය; සහ මහජන අධිකාරයන්ගේ නීත්‍යානුකූල ප්‍රතිපත්ති සැකසීම හා සමාන ක්‍රියාකාරීකම් පිළිබඳ යෝග්‍ය තොරතුරුය. | 0-10 |

| | |
|---|---|
| 30. ව්‍යතිරේකයන්ට අයත් වෙතැයි ගැනෙන අයදුම්කිරීම් ප්‍රතික්ෂේප කිරීම සිදු කළ යුත්තේ ඉල්ලා ඇති තොරතුරු අනාවරණයවීමෙන් සිදුවිය හැකි හානියේ ප්‍රමාණය තක්සේරු කිරීමේ පරීක්ෂණයකට අනුව සාධාරණ වන්නේ නම් පමණි. | 0-4 |
| 31. ව්‍යතිරේකයන් මගින් පනවා ඇති ආරක්ෂිත ආවරණය උල්ලංඝනය විය හැකිවුවද කිසියම් තොරතුරක් අනාවරණය කිරීම මහජන යහපත සඳහා අත්‍යවශ්‍යවෙතැයි සැලැකිය හැකි අවස්ථාවලදී ව්‍යතිරේකයන් නොතකා එම තොරතුරු අනාවරණය කිරීමට හැකියාව ලැබේ. මානව අයිතීන් උල්ලංඝණය වීම, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ හා වංචා දූෂණ වැනි දේ පිළිබඳ තොරතුරු ව්‍යතිරේකයන් නොතකා අනිවාර්යෙන් අනාවරණය කළ යුතුම 'බරපතළ' තොරතුරු ගණයට ගැනේ. | 0-4 |
| 32. අයදුම් කළ තොරතුරු ව්‍යතිරේකයකට ගැනෙනවිට ව්‍යතිරේකයෙන් නියමිත සීමාව ඉකුත් වූ වහාම තොරතුරු සැපයීම කළයුතුය. (උදාහරණයක් වශයෙන් ගත්විට ටෙන්ඩර් පිරිනැමීමේ ක්‍රියාවලියකදී තෝරාගත් ටෙන්ඩරය තීරණය වූ වහාම ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉල්ලාතිබූ තොරතුරු මුදා හැරීම කළ යුතුවේ.) වසර විස්සක් ඉක්මවූ ඕනෑම තොරතුරක් ව්‍යතිරේක නොතකා ලබා ගැනීමට නීතිය ඉඩ සලසයි. | 0-2 |
| 33. රහස්‍ය භාවය ආරක්ෂා කිරීමේ පදනම මත සපයන ලද තොරතුරු සම්බන්ධයෙන් තෙවැනි පාර්ශවයක් හා ගනුදෙනු කිරීම පිළිබඳ විධිවිධාන ඉතා පැහැදිලිවේ. තොරතුරු අයදුම් සම්බන්ධයෙන් තෙවැනි පාර්ශවයක් විසින් දක්වන විරෝධතා තොරතුරු සැපයීමේදී බලධාරීන් විසින් සලකා බලනු ලබන නමුත් තොරතුරු සැපයීම වැලැක්වීමේ නිෂේධ බලයක් එකී තුන්වැනි පාර්ශවයට හිමි නොවේ. | 0-2 |
| 34. කිසියම් වාර්තාවක කොටසක් පමණක් ව්‍යතිරේකයකින් ආවරණය වන අවස්ථාවලදී සෙසු කොටස් අනාවරණය කිරීමට හැකිවනසේ නීතිය විශේෂ වගන්තියකින් සමන්විතයි. | 0-2 |
| 35. ඉල්ලා ඇති තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවලදී එම තීරණය ගත් බලධාරියා එම ප්‍රතික්ෂේප කිරීමට නිශ්චිත හේතු සහ එම තීරණයට එරෙහිව අභියාචනා කළ හැකි ආකාරය පැහැදිලි ලෙස අයදුම්කරුට දැනුම් දිය යුතුවේ. | 0-2 |

## 5. පලදායී අභියාචනා විධිවිධාන -/30

| දර්ශකය | ලකුණු පරාසය |
|---|---|
| 36. තොරතුරු අයැදුමක් ප්‍රතික්ෂේප වූ විට බාහිර අභියාචනයක් කිරීමට පෙර අභ්‍යන්තරික අභියාචනයක් ( තොරතුර අයැදුම ලබාගත් ආයතනයේ නිසිබලධාරියා විසින් ඉල්ලීම ප්‍රතික්ෂෙප කළ අවස්ථාවල එම ආයතනයේ ප්‍රධානියාට අභියාචනා කිරීම වැනි ආයතනික අභියාචන) කිරීම අනිවාර්ය වන අවස්ථාවලදී එකී අභ්‍යන්තරික අභියාචනා පටිපාටිය ඉතා සරලවූ හා ගාස්තු අයකිරීමකින් තොරව ක්‍රියාත්මක වන එකක් විය යුතු අතර පැහැදිලි නිශචිත කාල සීමාවක් තුළ (වැඩ කරන දින 20කට නොවැඩි) අභ්‍යන්තරික අභියාචනය විමසා තීන්දු කළ යුතුය. | 0-2 |
| 37 නීතිය යටතේ ස්ථාපිත කර ඇති ස්වාධීන තොරතුරු කොමිසම හෝ ඒ සමාන ස්වාධීන තොරතුරු අධීක්ෂණ කොමිසමකට අභියාචනා ඉදිරිපත් කොට විසඳුම් ලබා ගැනීමට අයදුම්කරුවන්ට හැකිය. | 0-2 |
| 38. ඉහතකී තොරතුරු අධීක්ෂණ කොමිසමේ සාමාජිකයන් පත්කිරීමේ විධිවිධාන දේශපාලන ඇඟිලි ගැසීම් වැලැක්වීම සඳහා වෙසෙසින් සැකසී ඇති අතර කොමිසමේ සාමාජිකයන් ඉවත් කිරීම අත්තනෝමතික ලෙස සිදුවීම වැලැක්වීම පිණිස ඔවුන්ගේ නිල කාලය ආරක්ෂා කිරීමේ විධිවිධානද නීතියට ඇතුළත්ය. | 0-2 |
| 39. තොරතුරු අධීක්ෂණ කොමිසම පාර්ලිමේන්තුවට සෘජුව වගකියන අතර පාර්ලිමේන්තුව විසින් වෙන්කරන හෝ කොමිසමේ මූල්‍ය ස්වාධීනත්වය ආරක්ෂා කෙරෙන වෙනයම් ආකාරයකින් හෝ සැපයෙන ප්‍රතිපාදන මගින් කොමිසමට අවශ්‍ය කෙරෙන අරමුදල් සැපයේ. | 0-2 |
| 40. තොරතුරු අධීක්ෂණ කොමිසමේ සාමාජිකයන් පත් කිරීමේදී පක්ෂග්‍රාහී දේශපාලන සම්බන්ධකම් ඇති පුද්ගලයන් පත්වීම වැලැක්වීම සහ වෘත්තීය සුදුසුකම් සහිත අය පත්කර ගැනීමට අවශ්‍ය විධිවිධාන නීතිය මගින් සැලසේ. | 0-2 |
| 41 තොරතුරු අධීක්ෂණ කොමිසමට සිය කටයුතු කාර්යක්ෂම ලෙස හා ස්වාධීනව කරගෙනයාමට අවශ්‍ය වරය හා බලතල නීතිය මගින් පවරා දී තිබේ. මෙම බලතල වලට රහස්‍ය ලේඛන පරීක්ෂා කර බැලීමේ බලය හා මහජන ආයතන පරිශ්‍රයන් පරීක්ෂා කර බැලීමේ බලයද අයත් වේ. | 0-2 |
| 42. තොරතුරු අධීක්ෂණ කොමිසමේ තීරණ ක්‍රියාත්මක කිරීමට සියල්ලෝම නීතියෙන් බැඳී සිටිති. | 0-2 |
| 43. අයදුම්කරුවන්ගේ අභියාචනා විභාග කිරීම සම්බන්ධයෙන්, රහස්‍යයැයි සැලකෙන තොරතුරු අනාවරණය කරන ලෙස විධානය කිරීමේ බලයද ඇතුළුව අභියාචනා සම්බන්ධයෙන් නිසි විසඳුම් ලබාදීමේ සියලු බලතල තොරතුරු අධීක්ෂණ කොමිසමට හිමිය. | 0-2 |
| 44. තොරතුරු අධීක්ෂණ කොමිසමට අභියාචනා කිරීමේ අයිතියට අතිරේකව අධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීමටද තොරතුරු අයදුම්කරුට නීතියෙන් ඉඩ සැලසේ. | 0-2 |

| | |
|---|---|
| 45. සියළු අභියාචනා (අභ්‍යන්තරික හා බාහිර අභියාචනා දෙවර්ගය) සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරෙන අතර නීතිඥ සහයකින් තොරව අභියාචනාව පවත්වා ගෙන යාමට අයදුම්කරුට ඉඩ ඇත. | 0-2 |
| 46. පුළුල් වූ හේතු මත බාහිර අභියාචනා ඉදිරිපත් කිරීමට ඉඩ ලැබේ. (තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම පමණක් නොව ඉල්ලා සිටි ආකෘතියට අනුව තොරතුරු සැපයීමට නොහැකිවීම, පරිපාලනමය නිශ්ශබ්දතාවය හා නියමිත කාලසීමාවන් උල්ලංඝනය කිරීම, තොරතුරු සඳහා අධික ගාස්තු නියම කිරීම වැනි අනෙකුත් අවස්ථා සම්බන්ධයෙන්ද අභියාචනා කිරීමේ ඉඩකඩ සැලසේ. | 0-4 |
| 47. බාහිර අභියාචනා සම්බන්ධයෙන් ඇති ක්‍රියාපටිපාටිය නිශ්චිත කාලසීමාවන්ද සහිතව පැහැදිලි ලෙස සැකසී ඇත. | 0-2 |
| 48. අභියාචනා විභාග කිරීමේදී තොරතුරු අයිතිය පිළිබඳ නීතිය මගින් සලසා ඇති විධිවිධාන උල්ලංඝනය කර නොමැති බව ඔප්පු කිරීමේ වගකීම ආණ්ඩුව භාරගත යුතුය. | 0-2 |
| 49. අභියාචනයට නිමිත්ත වූ ආයතනයක ව්‍යුහාත්මක වෙනස් කිරීම් කරන ලෙස විධානය කිරීමට බාහිර අභියාචනය විභාග කරන අධිකාරියට බලය ලැබේ (උදාහරණයක් ලෙස කාර්ය මන්ඩලයට අතිරේක පුහුණුවක් ලබා දීම හෝ වඩා කාර්යක්ෂම වාර්තා කළමනාකරණයක් පවත්වා ගෙන යාමට නියම කිරීම වැනි විධාන.) | 0-2 |

## 6. තොරතුරු අයිතිය තහවුරු කිරීමේ ආරක්ෂණ හා දණ්ඩන -/8

| දර්ශකය | ලකුණු පරාසය |
|---|---|
| 50. වාර්තා විනාශ කිරීම වැනි ක්‍රියා මගින් තොරතුරු ලබාගැනීමේ අයිතිය උල්ලංඝනය කරන්නන්ට දඬුවම් නියම කිරීමට නීතිය ඉඩ සලසයි. | 0-2 |
| 51. තොරතුරු  ඉල්ලුම් සැපයීමට නිරන්තරයෙන්ම අසමත්වන හෝ ඉල්ලීම් අඩුලුහුඬු ලෙෂ ඉටුකරන මහජන ආයතන පිළිබඳ ප්‍රශ්න විසඳීමේ බලය නීතිය මගින් සලසා ඇත.(උදාහරණයක් වශයෙන් එකී ආයතනවලට දඬුවම් පැමිණවීම හෝ නිශ්චිත ප්‍රතිකාරක ක්‍රියාවන් ඉටුකරන ලෙස නියම කිරීම) | 0-2 |
| 52.තම කාර්ය නිසි ලෙස ඉටු කිරීමේ යහපත් අධ්‍යාශයෙන් කරනු ලබන කිසියම් කටයුත්තක් හෝ භාවිත කරන නිසි බලයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයකට භාජනය නොවීමේ මුක්තිය ස්වාධීන තොරතුරු අධීක්ෂණ කොමිසමට හා එහි කාර්යමණ්ඩලයට හිමිවේ. තොරතුරු අයිතිය පිළිබඳ නීතියට අනුව යහපත් අධ්‍යාශයෙන් තොරතුරු සපයන අන්‍යන්ටද මෙම මුක්තිය නීතියෙන් ම හිමිවේ. | 0-2 |
| 53. වැරදි ක්‍රියාවන් අනාවරණය කිරීමේ යහපත් අධ්‍යාශයෙන් තොරතුරු මුදාහරින සියල්ලන්ම නීතිය මගින් ආරක්ෂාකෙරේ. (උදාහරණයක් ලෙස දූෂණ හා වංචාවක් සම්බන්ධව අනතුරු අඟවන අය) | 0-2 |

## 7. තොරතුරු ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීමේ විධිවිධාන -/16

| දර්ශකය | ලකුණු පරාසය |
|---|---|
| 54. තොරතුරු සැපයීමේ වගකීම ඉටුකරනු වස් තොරතුරු සැපයීමේ නීතියෙන් ආවරණය වන සියලු ආයතන ඒ සඳහාම වෙන්වූ නිලධාරීන් (තොරතුරු නිලධාරී) පත්කිරීම හෝ ඒකකයන් පිහිටුවීම කළ යුතුය. | 0-2 |
| 55. තොරතුරු ලබා ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම තොරතුරු අධීක්ෂණ කොමිසමට හෝ නිශ්චිත රජයේ දෙපාර්තමේන්තුවකට නීතිය මගින් පැවරේ. | 0-2 |
| 56. තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළවෙලක් දියත් කිරීම (තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ ප්‍රකාශන හා පාසැල් වල අධ්‍යාපනික වැඩ සටහන් ආදිය මගින්) නීතිය මගින් නියම කෙරේ. | 0-2 |
| 57. වාර්තා හා තොරතුරු පවත්වාගෙන යාමේ අවම ප්‍රමිතීන් හඳුන්වාදීම හා ඉටු කිරීම නීතිය මගින් නියම කෙරේ. | 0-2 |
| 58. තමන් භාරයේ පවතින හා පවත්වාගෙන යන තොරතුරු ලේඛන ලයිස්තුගත කොට ප්‍රසිද්ධ කිරීම හා එම ලයිස්තු කලින් කලට යාවත්කාලීන කිරීම තොරතුරු නීතිය යටතට ගැනෙන ආයතන විසින් කළ යුතුබව නීතියෙන් නියම කෙරේ. | 0-2 |
| 59. තොරතුරු ඉල්ලුම් සම්බන්ධ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම පිළිබඳ බලධාරීන් පුහුණු කිරීම නීතියෙන් නියම කෙරේ. | 0-2 |
| 60. තමන් විසින් කළමනාකරනය කළ තොරතුරු ඉල්ලුම් සම්බන්ධ වාර්ෂික වාර්තාවක් නිකුත් කිරීම තොරතුරු නීතිය යටතට ගැනෙන සියලු ආයතන වල වගකීම බව නීතියෙන් නියම කෙරේ. මෙම වාර්තාවල ලැබුණු තොරතුරු ඉල්ලුම් ගණන හා ඒ සමබන්ධව කටයුතු කළ ආකාරය පිළිබඳව සංඛ්‍යා ලේඛන අඩංගුවිය යුතු බව සඳහන් වේ. | 0-2 |
| 61. ඉහත වාර්තා පදනම් කොටගෙන තොරතුරු ඉල්ලීමේ අයිතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ වාර්ෂික වාර්තාවක් තොරතුරු අධීක්ෂණ කොමිසම හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව නීතිය නියම කරයි. | 0-2 |

ඉහත දර්ශක අනුව විවිධ රටවල තොරතුරු අයිතිය පිළිබඳ නීතියේ සඵලදායීතාවය පිළිබඳ වගුව

